උපදෙස් පත්‍රිකාව

# ලංසු කැඳවීමයි.

# ධීවර අමාත්‍යාංශය.

**<u>ගොඩනැගිල්ල සහ පරිශ්‍රයේ සනීපාරක්ෂක සේවා කටයුතු ඉටු කිරීම සඳහා ලංසු කැඳවීම - 2024/2025</u>**

ධීවර අමාත්‍යාංශයේ ගොඩනැගිලි සහ අමාත්‍යාංශයට අයත් පරිශ්‍රය වර්ෂයක කාලයක් සඳහා සනීපාරක්ෂක සේවා කටයුතු ඉටු කිරීම වෙනුවෙන් පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන ලංසුකරුවන්ගෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් 2024.04.09 දින සිට 2024.04.29 දින පෙ.ව. 10.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

1.
   a. අදාල ආයතනය ගොඩනැගිලි පවිත්‍රතා සහ නඩත්තු සේවා පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් රජයේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.
   b. ලියාපදිංචිය ලබා ගැනීමෙන් අනතුරුව එකී කාර්ය සම්බන්ධව රාජ්‍ය අංශයේ හෝ සංස්ථා / ව්‍යවස්ථාපිත ආයතනවල අවම වශයෙන් වසර 02 කට නොඅඩු පලපුරුද්දක් ලබා තිබිය යුතුය.
   c. ලංසු ඉදිරිපත් කල යුත්තේ ධීවර අමාත්‍යාංශය මගින් ලබා ගත් ආකෘති පත්‍ර මගින් පමණි

2. ලංසු ලේඛණ ලබාගත යුත්තේ,
   a. පහත ලිපිනය වෙතින් 2024.04.09 දින සිට 2024.04.26 දින අතර සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 09.00 සිට ප.ව 03.00 දක්වා කාලය තුළය.
   b. ලංසුපත් ලබා ගැනීමට පෙර ආපසු නොගෙවනු ලබන රු. 2000/- ක ලේඛණ ගාස්තුවක් ධීවර අමාත්‍යාංශයේ කොළඹ 10, මාළිගාවත්ත, නව මහලේකම් කාර්යාලයේ පිහිටි දෙවන මහලේ මුදල් අංශයේ සරප් වෙත මුදලින් ගෙවා ලදුපතක් ලබා ගත යුතුය.
   c. එම ලබා ගන්නා ලදුපත හා ලංසුකරු විසින් තම ලිපි ශීර්ෂ සහිත වූ ලංසු ලේඛණ ඉල්ලුම් කරනු ලබන ලිපියක් සමග ගණකාධිකාරී (සැපයීම්) වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත කාලය තුල ලංසු ලේඛණ ලබාගත හැකිය.
   d. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද පිළිගත්, වාණිජ බැංකුවකින් නිකුත් කරනු ලබන රු.90,000/= ට සමාන වටිනාකමිකින් යුතු ලංසු සුරක්ෂණය ලේකම්, ධීවර අමාත්‍යාංශය නමින් ඉදිරිපත් කල යුතු අතර, එකී ඇපකරය 2024.08.12 දින දක්වා වලංගු විය යුතුය

3. නිසියාකාරව සම්පූර්ණ කරන ලද ලංසු ලේඛණ 2024.04.29 දින පෙ.ව. 10.00 පෙර ලැබෙන සේ පහතින් සඳහන් කර ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දෙන්නේ නම් පහතින් සඳහන් ලිපිනයෙහි පිහිටි දෙවන මහලේ මුදල් අංශයේ ගණකාධිකාරී (සැපයීම්) කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ යුතුය.

4. ලංසුපත් විවෘත කරනු ලබන අවස්ථාවේදී ලංසුකරුට හෝ ඔහු විසින් බලය පැවරූ නියෝජිතයෙකුට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. 2024.04.29 දින පෙ.ව. 10.00 ලංසු කැඳවීම අවසන් කල වහාම ලැබී ඇති ලංසුපත් විවෘත කරනු ලැබේ.

5. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් විස්තර අවශ්‍ය වන්නේ නම් 011- 2328990 දුරකථන අංකය අමතා ගණකාධිකාරී (සැපයීම්) වෙතින් ලබා ගත හැකිය.

සභාපති
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ 10.